# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ධීවර අමාත්‍යාංශය

**මාළිගාවත්ත, කොළඹ -10**

**වැය ශීර්ෂ අංකය : 151**

| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|


**01. ආයතනික පැතිකඩ**

1.1. හැඳින්වීම **03**

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු **04**

1.3. ප්‍රධාන කාර්යයන් **04**

1.4. සංවිධාන සටහන **05**

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන **06**

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල් **07**

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු **08**

**02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම** **09**

**03. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය **11 - 12**

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය **13**

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **14**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් **15**

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **16**

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය **16**

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන **16 - 17**

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය **17**

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව **18**

**04. කාර්ය සාධන දර්ශක**

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) **19**

**05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු **20**

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් **21 - 23**

**06. මානව සම්පත් පැතිකඩ**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය **24**

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය **24**

6.3. මානව සම්පත් සංවර්ධනය **24**

**07. අනුකූලතා වාර්තාව** **25 - 30**

# 01 - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුද, කලපු හා අභ්‍යන්තර ජලාශ මනාලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන ධීවර කර්මාන්තයක් බිහිකිරීම උදෙසා ධීවර අමාත්‍යාංශය කටයුතු කරන අතර මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නෝත්සී ලිමිටඩ් ආයතනය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, සීමාසහිත සීනෝර් පදනම යන ආයතන ක්‍රියාත්මක වේ.

රජයේ ප්‍රතිපත්ති වලට හා නියමිත අණපනත් වලට අනුකූලව ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා ධීවර සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා වන ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ සැලසුම් සම්පාදනය ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානතම කාර්යභාරය වේ. මෙයට අමතරව රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර විෂයන්ට සහ අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීමට අදාල පහත සඳහන් කාර්යයන් ධීවර අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන මගින් සිදු කරනු ලබයි.

- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම,
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම හා විධි ප්‍රතිසංස්කරණය කිරීම,
- ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම තුලින් මත්ස්‍ය වගාවන් පුළුල් කිරීම, ජීව හා අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම, නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාල ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම,
- රජයට අයත් ධීවර යාත්‍රා කලමනාකරණය හා මෙහෙයවීම, පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් වන පරිදි මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කටයුතු පුළුල් කිරීම,
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම් වලට අවස්ථාව ලබා දීම,
- ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ අනවසරයෙන් මසුන් ඇල්ලීම නතර කිරීම,
- දේශීය ටින්මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම,
- ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම,
- අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය, ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රම හඳුන්වාදීම,
- සාගර විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කලමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමුද්‍ර කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කලමනාකරණය,
- බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම
- සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම හා ධීවර වරායවල් සහ නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කලමනාකරණය සිදු කිරීම


## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

| |
|---|
| **දැක්ම**<br><br>ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම. |
| **මෙහෙවර**<br><br>වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම. |
| **ප්‍රතිපත්තිමය අරමුණු**<br><br>• විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම.<br>• ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.<br>• සමුද්‍රිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.<br>• ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.<br>• පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.<br>• ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.<br>• අපනයන ආදායම් ඉහළ නැංවීම.<br>• විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.<br>• ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම. |

## 1.3. ප්‍රධාන කාර්යයන්

- **සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම**
- **ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම**
- **ජාතික ජලජ සම්පත් සංවර්ධනය හා තිරසාර ලෙස භාවිතා කිරීම**
- **නිෂ්පාදන අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
- **පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම**
- **මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම**

# 1.4. සංවිධාන සටහන



## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

| | |
|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) | **අපේක්ෂිත අරමුණු** - ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය.<br><br>**වගකීම්** - කලාපීය සහ අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසි වලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම. |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | **අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය.<br><br>**වගකීම්** - 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) | **අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව ප්‍රවර්ධනය, කළමනාකරණය සහ නියාමනය.<br><br>**වගකීම්** - 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මගින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම, මිරිදිය හා ජලජීවී වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම. |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) | **අපේක්ෂිත අරමුණු** - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 23 ක් හා නැංගුරම්පොළවල් 15 ක් පවත්වාගෙන යාම. |
| ලංකා ධීවර සංස්ථාව (CFC) | **අපේක්ෂිත අරමුණු** - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපොල සඳහා දායක වීම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකරයි. |
| සීමාසහිත සීනෝර් පදනම | **අපේක්ෂිත අරමුණු** - ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.<br><br>**වගකීම්** - 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු, බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරයි. |
| නෝත්සී ලිමිටඩ් | **අපේක්ෂිත අරමුණු** - දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම.<br><br>**වගකීම්** - 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ ආරම්භ කර, 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි. |

## 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අරමුදල්

| ආයතනය | වැඩසටහන | වෙන්කල ප්‍රතිපාදන (රු. මිලි) |
|---|---|---|
| | කලපු සංවර්ධනය හා සංරක්ෂණය | |
| | ගන්දර ධීවර වරාය සංවර්ධනය කිරීම සහ වෙල්ලමංකර නව ධීවර වරායක් සංවර්ධනය කිරීම | |
| | බලපිටිය ධීවර වරාය ඉදිකිරීම | |
| | ගන්දර ධීවර වරාය ඉදිකිරීම | |
| | මීගමුව කලපුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | |
| | රැකව නැංගුරම් පොළ ඉදිකිරීම | |
| | මාවැල්ල නැංගුරම් පොළ ඉදිකිරීම | 2000.00 |
| | ඔරුවැල්ල පුවත්පත සහ ධීවර නවෝදය ගුවන් විදුලි වැඩසටහන | 11.70 |
| | උතුරු පළාත් තිරසාර ධීවර සංවර්ධන වැඩසටහන | 10.00 |
| | ධීවර හා ජලජ අංශයේ සංවර්ධන කටයුතු | 1,000.00 |
| | ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය | 276.00 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR | සංවර්ධන ක්‍රියාකාරකම් | 26.00 |
| ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) | සංවර්ධන ක්‍රියාකාරකම් | 10.00 |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | සංවර්ධන ක්‍රියාකාරකම් | 10.00 |
| | | 25.00 |
| | | 2.66 |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) | සංවර්ධන ක්‍රියාකාරකම් | 50.00 |
| | එකතුව (ධීවර අමාත්‍යාංශය) | **3,421.36** |

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ආයතනය | TEC රුපියල් මිලියන | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 01. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බහුදින ධීවර යාත්‍රා සඳහා ගොඩබිම් පාදක ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ දුපත් චන්ද්‍රිකා පදනම් කරගත් VMS ට්‍රාන්ස්පොන්ඩර් ඒකකය 4244 සැපයීම සහ ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | ඕස්ට්‍රේලියානු අරමුදල් | 1207.425 | වසර 3 |
| 02. | ශ්‍රී ලංකා ජලාශවල වරල් මාළු සහ යෝධ මිරිදිය ඉස්සන් වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තයේ ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය | | වසර 3 |
| 03. | ඵලදායී ජෛව ආරක්ෂණය සහ ඩිජිටල් තාක්ෂණය හරහා සුහුරු සහ තිරසාර ජලජීවී වගාව | ආහාර හා කෘෂිකාර්මික සංවිධානය යටතේ කොරියානු අරමුදල් | 424 | වසර 5 |
| 04. | මුහුදු කූඩැල්ලන් ජලජීවී වගාව සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය,ක්ෂය වූ වන සම්පත ප්‍රතිස්ථාපනය සහ කළමනාකරණය | ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | 71.8 | වසර 2 |
| 05. | ධීවර කර්මාන්තයේ පසු අස්වනු හානි අවම කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම | ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | 7.8 | වසර 2 |
| 06. | තිරසාර සංවර්ධනය සඳහා ධීවර හා ජලජීවී සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කිරීම | ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | 2728.6 | වසර 3 |
| 07. | ශ්‍රී ලංකාව වටා වෙරළබඩ ජල ලවණතාවය නිරීක්ෂණය | ඕස්ට්‍රේලියානු අරමුදල් | 1.2 | වසර 2 |

.2022.06.01 දිනට විනිමය අනුපාතිකය- 1 USD = රු. 359

## 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජය මගින් 2022 වසර සඳහා වෙන් කරන ලද සම්පූර්ණ ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 3,521.9 කි. එම වසර තුල වෙන් කරන ලද ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයෙන් රු.මි. 2,442.2 ක ප්‍රමාණයක් වැය කර ඇත.

කොවිඩ් වසංගත තත්වය මත ඇතිවූ ආර්ථික අවපාත තත්වය හා ඉන්ධන මිල ඉහල යාම ධීවර කර්මාන්තයේ ප්‍රගමනයට දැඩි බලපෑමක් එල්ල වුවද, 2022 වසර තුලදී කරදිය ධීවර කර්මාන්තය තුලින් මෙ.ටො. 280,610 ක හා මිරිදිය ධීවර කර්මාන්තය තුලින් මෙ.ටො. 116,620 ක මත්ස්‍ය අස්වැන්නක් ලබාගැනීමට සමත් වී ඇත. ඒ අනුව මෙම කාලපරිච්ඡේදය තුල සමස්ථ නිෂ්පාදනය මෙ.ටො. 397,230 කි.

ජාතික ආර්ථිකය හා විදේශ සංචිතයන්හි වර්ධනයට මත්ස්‍ය අපනයනය තුලින් සුවිශේෂී දායකත්වයක් සපයන අතර 2022 වසර තුලදී අපනයනය කරන ලද සමස්ත මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො. 25,730 කි. එහි වටිනාකම  රු.මි. 97,243 කි. එය 2021 වසරේ අපනයන ආදායමට වඩා වර්ධනයකි. මෙය ධීවර ක්ෂේත්‍රය තුල ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කල හැක. එසේම අදාල කාලපරිච්ඡේදය තුලදී විසිතුරු මසුන් අපනයනය තුලින් රු.මි. 7,143 ක අදායමක් ලබා ගැනීමට හැකිවී ඇත. මෙයද පසුගිය වර්ෂයන්ට වඩා වාර්තාගත අපනයන ආදායමක් ලෙස සැලකිය හැක.

මහජනතාවගේ පෝෂණ මට්ටම ඉහල මට්ටමක පවත්වා ගැනීම සඳහා ප්‍රධානතම ප්‍රෝටීන් මූලාශ්‍රය ලෙස මත්ස්‍ය පරිභෝජනය සැලකිය හැකි අතර 2022 වසර තුලදී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 31.3 කි. දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග වලින් ඉදිරියේදී මෙම අංශයෙහි ක්‍රමික වර්ධනයක් අපේක්ෂා කෙරේ.

2022 වසර තුල ඉන්ධන හිඟ තත්ත්වය, ශ්‍රම වියදම ඉහලයාම, ප්‍රධාන වශයෙන් අයිස් වැනි යෙදවුම් හා ආම්පන්න වල මිල ඉහලයාම ගැඹුරු මුහුදේ මත්ස්‍ය අස්වැන්න කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කෙරිණි. සමස්තයක් වශයෙන් ගත් කල ආර්ථික වශයෙන් රට මුහුණ දී ඇති දුෂ්කර කාලපරිච්ඡේදයක වුවද ධීවර අමාත්‍යාංශය විසින් තමා යටතේ වූ ධීවර දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන සමඟ සාමූහිකව ගන්නා ලද සියළු සැලසුම් හා ක්‍රමෝපායන් හේතුවෙන් මත්ස්‍ය අපනයනයන් තුලින් රටට ඉහල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට හැකිවිය. රජයේ ප්‍රතිපත්ති සහ නියමිත අණපනත්වලට අනුකූල වෙමින් ධීවර අංශයේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක හා ජාතිකත්ව නිර්ණය කළ දායකත්ව අනුව යමින් සපුරා ගැනීමට සැලසුම් හා ව්‍යාපෘති දියත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

එක්ස්ප්‍රස් පර්ල් නම් භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාව 2021.05.20 දින ශ්‍රී ලංකා මුහුදු තීරයේදී ගිනිගැනීමකට ලක්වූ අතර, පසුව එය සම්පූර්ණයෙන් ගිනිගෙන මුහුදුබත් විය. මෙම සිද්ධිය හේතුවෙන් ධීවරයින්ට, ධීවර යාත්‍රාවලට හා ධීවර ආම්පන්නවලට සිදුවිය හැකි හානිය වැළැක්වීමේ අරමුණෙන් 2021.05.21 දින සිට මීගමුව සිට පානදුර දක්වා මුහුදු තීරයේ ධීවර කටයුතු තහනමක් පනවන ලදී. මෙම ධීවර තහනම හේතුවෙන් මුල් අවස්ථාවේදී ඍජු ලෙස ධීවර රැකියාවේ යෙදෙන ධීවරයන් 15,032 දෙනෙකුට හා ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරතවන්නන් 4,891 දෙනෙකුගේ ජීවිකාව අහිමිවූ අතර ධීවර තහනම් කළාපය ක්‍රම ක්‍රමයෙන් සංශෝධනය කිරීමේදී ජීවිකාව අහිමිවූ පුද්ගල සංඛ්‍යාවේ ද අඩුවක් වාර්තා විය. මුල් අවස්ථාවේ වර්ග කිලෝමීටර 457 ක ප්‍රදේශයක ක්‍රියාත්මක වූ ධීවර තහනම අවසානයේ නැව මුහුදුබත් වී ඇති ස්ථානයේ සිට කි.මී 2ක අරයකින් යුත් ප්‍රදේශය (වර්ග කිලෝමීටර 12.6) හැර ඉතිරි ප්‍රදේශය 2022.06.05 දින සිට සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී. මෙම ධීවර තහනම හේතුවෙන් ජීවිකාව අහිමිවූ ධීවරයින්ට හා ආශ්‍රිත රැකියාවල නිරතවූවන්ට නැවේ රක්ෂණ ආයතන වෙතින් වන්දි ලබාදීමට ධීවර අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු කරන ලදී. ඒ අනුව මේ දක්වා රුපියල් මිලියන 1,686 ක පමණ මුදලක් අතුරු වන්දි වට 3 යටතේ ධීවර ක්ෂේත්‍රයේ වන්දි ගෙවීම සඳහා රක්ෂණ ආයතනය වෙතින් ලැබී ඇති අතර එම මුදල 2022.12.31 දින වන විට ධීවර ජනතාව වෙත බෙදා දී ඇත. සිව්වන අතුරු වන්දිය වශයෙන් ලැබී ඇති රු.මිලියන 1,604 ක මුදල 2023 වසරේ පළමු කාර්තුවේදී ධීවරයන් අතර බෙදා දීමට නියමිතය.

වෙල්ලමන්කර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018.06.26 වන දින ආරම්භ කරන ලද අතර එහි ව්‍යාපෘති වටිනාකම රු.මි. 2,498 ක් වේ. ධීවර වරායෙහි බහුදින ධීවර කටයුතු සඳහා දියකඩන දෙකක් (මුළු දිග මීටර් 710ක් පමණ), ඉන්ධන බෙදාහැරීමේ පහසුකම් ස්ථාන (ඩීසල් සහ භූමිතෙල් දෙකම), වේදිකා බැම්ම, වැලිකඩනය, වරාය ද්‍රෝණියේ හෙක්ටයාර 7.6ක් සහ අනෙකුත් වෙරළ පහසුකම් ඇතුළු සියලු පහසුකම් වලින් සමන්විත මෙම ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි වැඩ 2022.03.15 දින අවසන් කර මෙහෙයුම් කටයුතු සඳහා ධීවර වරාය නිතීගත සංස්ථාව වෙත බාර දී ඇත.

කලමැටිය ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014.07.15 වන දින රු.මි. 1,280.79 ක ව්‍යාපෘති වටිනාකමකින් යුක්තව ආරම්භ කරන ලද අතර, 2020 වර්ෂය වන විට සියලුම වැඩ නිම කර ඇත. මෙම ධීවර වරායයෙහි දියකඩනයක් (ආසන්න වශයෙන් මුළු දිග මීටර් 335), වේදිකා බැම්ම, වැලිකඩනය, වෙන්දේසි ශාලාව, ඉන්ධන බෙදාහැරීමේ පහසුකම් ස්ථාන (ඩීසල් සහ භූමිතෙල් යන දෙකම), දැල් සකස් කිරීමේ හෝල් 01 සහ 02 ආදී පහසුකම් වලින් සමන්විත මෙම ධීවර වරායෙහි අවශ්‍ය ඉදිකිරීම් සිදු කර මෙහෙයුම් කටයුතු සඳහා ධීවර වරාය නිතීගත සංස්ථාව වෙත බාරදී ඇත.

## 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022<br>රු. | | සටහන | තථ්‍ය<br>2022<br>රු. | තථ්‍ය<br>2021<br>රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,599,630,364 | 2,693,148,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 247,304,884 | 189,514,931 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 10,158,024 | 9,102,093 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,857,093,272** | 2,891,765,024 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,857,093,272** | 5,783,530,048 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **2,857,093,272** | 5,783,530,048 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 145,010,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේව | 5 | 139,715,711 | 112,138,631 | |
| 134,063,240 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 111,254,821 | 72,077,585 | ඒසීඒ-2(ii) |
| 2,640,397,760 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,542,493,049 | 301,858,617 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 200,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 72,000 | 226,281 | |
| 2,919,671,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,793,535,581** | 486,301,114 | |
| | **මූලධන වියදම්** | | | | |
| 9,143,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 4,974,518 | 8,115,637 | |
| 90,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 48,326,875 | 46,523,499 | |
| 81,700,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 62,623,440 | 49,844,546 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,400,000 | හැකියා වර්ධනය | 14 | 877,650 | 507,065 | |
| 3,313,660,931 | වෙනත් මූලධන වියදම් | 15 | 2,316,822,886 | 2,566,812,790 | |
| 3,495,903,931 | **මුළු මූලධන වියදම් (උ)** | | **2,433,625,369** | 2,671,803,537 | |
| | තැන්පතු ගෙවීම් | | 71,386,227 | 49,619,736 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 11,763,453 | 7,036,504 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 83,149,680 | 56,656,240 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 5,310,310,630 | 3,214,760,891 | |

1

| | | | | |
|---|---|---|---|---|
| 6,415,574,931 | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | (2,453,217,359) | 2,568,769,157 | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | (2,453,217,359) | (322,995,867) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | - | - | **ඒසීඒ-3** |
| | | - | - | |

සටහන:2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියල කිරීමේදී 405 වැය ශීර්ෂය යටතේ පැවති ධීවර රාජ්‍ය අමාත්‍යාංශයද ඒකාබද්ධ කර ඇත.

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

### 2022 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 721,915,845 | 670,623,450 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 23,491,650 | 21,886,221 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **745,407,495** | **692,509,671** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (463,010,526) | (178,880,786) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 721,915.845 | 670,623,450 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 486,502,176 | 200,767,007 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **745,407,495** | **692,509,671** |

පිටු අංක 7 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23 . 02 . 23

ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10.

..........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23. 02 . 23

ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10.

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023-02-23

එච්.පී. සමන් ධර්මසිරි
ප්‍රධාන ගණකාධිකාරී
ධීවර අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ 10

2

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තතය | |
|---|---|---|
| | 2022 රු. | 2021 රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 42,901,238 | 76,337,798 |
| අග්‍රිම ලැබීම් | 2,599,969,931 | 2,693,148,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 9,860,005 | 7,633,379 |
| තැන්පතු ලැබීම් | 247,304,884 | 90,332,307 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,900,036,058** | **2,867,451,484** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 250,907,312 | 184,432,748 |
| සහනාධාර සහ මාරුකිරීම් | 4,649,049 | 32,633,617 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 451,516,452 | 8,292,134 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 339,567 | - |
| අත්තිකාරම් ගෙවීම් | 8,863,594 | 7,036,504 |
| තැන්පතු ගෙවීම් | 71,386,227 | 49,619,736 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **787,662,201** | **282,014,739** |
| | | |
| **(ආ)** | **2,112,373,857** | **2,585,436,745** |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| ගැනීම් | 2,112,373,857 | 2,585,436,745 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,112,373,857** | **2,585,436,745** |
| | | |
| **ඊ)=(ඇ)-(ඉ)** | **(2,112,373,857)** | **(2,585,436,745)** |
| | | |
| **ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**<u>වාර්තාකිරීමේ පදනම</u>**

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ''වාර්තාකරණ පදනම'' යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

### 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

| ආදයම් කේතය | ආදයම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තු | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තු | අවසන් ඇස්තමේන්තු | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී | 30 | 30 | 32 | 107% |
| 2002-02-99 | පොලිය - අනෙකුත් | 850 | 850 | 1,117 | 131% |
| 2003-02-99 | පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ | 20,000 | 20,000 | 35,304 | 176% |
| 2004-01-00 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් | - | - | 6,448 | 0% |

### 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 2,136,600 | 2,919,671 | 2,793,536 | 96% |
| ප්‍රාග්ධන | 3,493,200 | 3,495,904 | 2,433,625 | 67% |

### 3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | |
| 01. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සඳහා | 135 | 135 | 100% |
| 02 | ලේකම් ,ධීවර රාජ්‍ය අමාත්‍යාංශය | ජලාශයන්හි මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම | 490,000 | 214,373 | 44% |
| 03. | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍රය අලුත් කිරීම | 175 | 175 | 100% |
| 04. | දි.ලේ, යාපනය | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල අතැති බිල්පත් පියවීම සඳහා | 20,702 | 19,668 | 95% |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කරවල නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන කාන්තාවන් සඳහා උපකරණ ලබාදීම | 4,300 | 1,087 | 25% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 06. | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු සීමා, මායිම් කණු සිටුවීම හා කලපු කළමනාකරණ කමිටු ස්ථාපනය හා ධීවර සහභාගීත්ව කමිටු රැස්වීම් පැවැත්වීම | 56,500 | 20,845 | 37% |
| 07 | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | ඇඟිලි සලකුණු යන්ත්‍රය නැවත ස්ථාපිත කිරීමේ ගාස්තු ගෙවීම. | 4 | 4 | 100% |
| 08 | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | රැකව නැංගුරම්පොල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍ර අලුත් කිරීම | 50 | 50 | 100% |
| 09 | දිස්ත්‍රික් ලේකම්,කළුතර | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 53,598 | 52,887 | 99% |
| 10 | දිස්ත්‍රික් ලේකම්,කොළඹ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 258,586 | 256,283 | 99% |
| 11 | දිස්ත්‍රික් ලේකම්,ගම්පහ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 762,628 | 761,040 | 100% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යූහයන් | | 197,535 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 342,790 | | |
| 9153 | ඉඩම් | | 5,172 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 176,419 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } FLS/B/MF/2/22/13    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022 මැයි 26 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ධීවර අමාත්‍යාංශය

**ධීවර අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1.**   මූල්‍ය ප්‍රකාශන

**1.1**   තත්ත්වාගණනය කළ මතය

ධීවර අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2**   තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය (කෙටියෙන් ) | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| මුළු ආදායම, ශුද්ධ ආදායම ලැබීම් හා ආදායම් ලැබීම් | 1.6.2. (අ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.1.1.(ඇ) | විගණනයට අවශ්‍ය විස්තර ඉදිරිපත් නොකිරීම. | 1.6.6 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දෝෂ

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශයේ ඒසීඒ-2(ii) ප්‍රකාශයේ ධීවර අමාත්‍යාංශයේ සහ පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ වියදම් එකතුකර දැක්වීම නිසා එක් එක් අමාත්‍යාශවල ඉතිරිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට නොහැකි වූ අතර මේ නිසා සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ඉතිරිය දැක්වීම හා ඉතිරියට හේතු නිවැරදිව හෙළිදරව් කර තිබේ ද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. තව ද මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාව පැහැදිලි කිරීම පෙන්නුම් කරන ඒසීඒ-2(iii) ආකෘතිය ප්‍රකාශය තුළින් ප්‍රතිපාදනය හා වෙනස්කම්වලට හේතු දක්වා තිබුණ ද අමාත්‍යාංශ දෙක එකට එකතුකර දක්වා තිබීම නිසා එහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්වල මුළු එකතුව රු.2,891,765,024 ක් වුවද 2022 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 වර්ෂයට අදාල ආදායම දැක්වීමේ දී එම ශේෂය රු.5,783,530,048 ක් වී තිබූ බැවින් සන්සන්දනාත්මක තොරතුරුවල නිවැරදිතාවය තහවුරු නොවීය.

(ආ) ධීවර අමාත්‍යාංශයේ සහ පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් අංක 89/22 හා 443/22 යටතේ පිළිවෙලින් රු.2,228,832,931 ක් හා 371,137,000 ක් වශයෙන් එකතු වටිනාකම රු.2,599,969,931 ක් භාණ්ඩාගාරයෙන් අග්‍රිම වශයෙන් ලැබී ඇතත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර ප්‍රේෂණ අඩුකර භාණ්ඩාගාර අග්‍රිම ලැබීම ලෙස රු.2,599,630,364 ක් දක්වා තිබුණි. මේ නිසා රු.339,567 ක්වූ භාණ්ඩාගාර ප්‍රේෂණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ නොදක්වා ශුද්ධ ආදායම සමකර තිබුණි. සම්මත ආකෘතියෙන් පරිබාහිරව ගණුදෙනු සටහන් කර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ඒකාකාරී නොවිය.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඒසීඒ-සී) පරීක්ෂාවේ දී ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදීගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීමේ අගය රු.2,112,373,857 ක් විය. එහෙත් අමාත්‍යාංශ වැය ලෙජර් අනුව එම අගය රු.48,322,717 ක් විය.

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වල වටිනාකම රු.2,314,958,452 ක් බව විගණනයේ දී නිරීක්ෂණය වූ අතර එම අගය රු.250,907,312 ක් ලෙස එනම් රු.2,064,051,140 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

2022 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය සතු රු.721,915,845 ක වටිනාකමින් යුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා දී නොතිබූ අතර ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වත්කම් පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතී ද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය. එබැවින් රු.721,915,845 ක මූල්‍ය නොවන වත්කම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැක.

1.6.5 අග්‍රිම ශේෂය

වාර්ෂික අග්‍රිම ගිණුම් භාණ්ඩාගාර මුද්‍රිත සාරාංශය (SA 70) අනුව අංක 7002-0-0-089-0-18-0 දරන අග්‍රිම ගිණුමේ 2018 වර්ෂයේ සිට පැවත එන රු.6,400,000 ක්වූ ලංකා ධීවර සංස්ථාවේ නොපියවූ අග්‍රිම ශේෂයේ 2022 වර්ෂයේ ආරම්භයේ රු.5,316,337 ක ශේෂයක් පැවති අතර 2022 වර්ෂයේ අවස්ථා 6 කදී අග්‍රිමය පියවා 2022 නොවැම්බර් මස වනවිට එය නිරවුල් කර තිබුණි. ACA 3 ආකෘතියෙහි 2022 ජනවාරි 01 දිනට නොපියවූ උප අග්‍රිම ලෙස එම මුදල අමාත්‍යාංශය විසින් පෙන්නුම් කර නොතිබුණි.

1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා පිළිවෙලින් රු.569,000,000 ක් වූ ප්‍රතිපාදන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සඳහාද, රු.435,500,000 ක් වූ ප්‍රතිපාදන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සඳහාද හා රු.628,000,000 ක් වූ ප්‍රතිපාදන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) වෙත වෙන්කර දී තිබුණි. එමෙන්ම ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.276,000,000 ක අමතර ප්‍රතිපාදනයන් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සඳහා වෙන්කර දී තිබුණි. ධීවර අමාත්‍යාංශය යටතේ නියාමනය වන මෙම රාජ්‍ය ආයතන 03 සඳහා පැවති ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශය විසින් අක්මුදල් 2022 වර්ෂය තුල දී ලබා දී තිබුණද අදාල ආයතන විසින් ඉල්ලුම් කල අක්මුදල් ප්‍රමාණයන් කොපමණ ද යන්න පිළිබඳ විස්තර වවුචරයට අමුණා නොතිබුණු අතර, එක් එක් වැය විෂයය තුල ඇති උප ව්‍යාපෘති සඳහා ලබා දුන් අක්මුදල් ප්‍රමාණය, ඒවා වියදම් කල ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් වියදම් වාර්තා, තොරතුරු හා එම එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කල තොරතුරු හෝ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 1,753,907,569ක වියදම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ තහවුරු කරගැනීමට නොහැකි විය. ධීවර අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තින් මත පිහිටා ධීවර විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සඳහන් කර තිබුණ ද අමාත්‍යාංශය විසින් මෙම ආයතන පසුවිපරම් කිරීම හා ඇගයීම සිදුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආයතනය | සත්‍ය වියදම (2022) | | |
|---|---|---|---|
| | පුනරාවර්තන | මූලධන | එකතුව |
| | රු. | රු. | රු. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) | 761,490,069 | 10,000,000 | 771,490,069 |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | 400,497,500 | 34,920,000 | 435,417,500 |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) | 511,000,000 | 36,000,000 | 547,000,000 |
| | | | 1,753,907,569 |

**1.6.7** ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොත හා මුදල් රෙගුලාසි 454(3) ප්‍රකාරව පොත් නාමාවලිය පිළිබඳ ලේඛන ධීවර අමාත්‍යාංශය විසින් පවත්වා නොතිබුණි.

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 7002-0-0-443-0-22-0 දරන අග්‍රිම ගිණුමේ සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම්කල පරිදි ඉල්ලුම් කලයුතු අග්‍රිමය රු.2,172,185,000 ක් වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.371,137,000 ක් විය. අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂා කර තිබූ අපනයන වෙළඳපොල ඉලක්ක කර සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම, උපායශීලී සැලසුම් සකස් කිරීම මඟින් දිවයින ඇතුළත වැව්, කලපු සහ ගොඩබිම් ධීවර කටයුතු වර්ධනය කිරීම, බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතයෙන් ශීතකරණ පද්ධතියක් වැඩි දියුණු කිරීම සහ සූර්යබල ශක්ති භාවිතය දිරිමත් කරවීම, ධීවර වරායන් සහ නැංගුරම් පොළවල්වල අයිස් යන්ත්‍රාගාර, නවීන සන්නිවේදන පහසුකම්, ඉන්ධන සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ධීවර ප්‍රජා සංවිධාන අතර මුහුදු ජලය හා මිරිදිය මත්ස්‍ය ගහනය වර්ධනය කරගත හැකි අවබෝධාත්මක වැඩසටහන් ආරම්භ කිරීම, පාරිසරික හිතකාමී උසස් තාක්ෂණය භාවිතයෙන් මත්ස්‍ය අස්වැන්න වැඩිකිරීම සහ ධීවර කර්මාන්තවල නියැලී පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව දීම වැනි ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර, පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කල පරිදි උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) අංක 7002-0-0-89-0-22-0 දරන අග්‍රිම ගිණුමේ සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම්කල පරිදි ඉල්ලුම් කල යුතු අග්‍රිමය රු.9,658,227,000 ක් වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.2,228,832,931 ක් වූයෙන්, අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂා කර තිබූ වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම, අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාවන් ලබාදීම, ටින්මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම, නිෂ්පාදනයට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය

නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම, උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම, ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයන් හඳුන්වාදීම, සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාරකණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර, පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කල පරිදි උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

**2.2** වියදම් කළමනාකරණය
------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි **50** හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කලයුතු වුවත් පහත දැක්වෙන නිරීක්ෂණ අනුව එම මුදල් රෙගුලාසිය අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) පුනරාවර්තන වැය විෂයයන් **3** ක් හා මූලධන වැය විෂයයන් **4** ක් ඇතුලුව වැය විෂයයන් **7** ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.**2,930,000** ක මූලික ප්‍රතිපාදනයෙන් රු.**400,000** ක් වෙනත් වැය විෂයයකට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.**2,530,000** ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් **08** ක් හා මූලධන වැය විෂයයන් **02** ක් සඳහා සලසාගෙන තිබුණු රු.**56,050,000** ක් වූ මූලික ප්‍රතිපාදනයෙන් රු.**20,160,300** ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.**35,889,700** ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.**33,409,351** ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට **75** ත් සියයට **99** ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) **2022** වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් **151-1-1-0-1102-11** දරන වැය විෂයය සඳහා සලසාගෙන තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට **80** ක ප්‍රතිශතයක් මුදල් රෙගුලාසි **66** මගින් වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණි.

(ආ) සංවර්ධන වැඩසටහන් වලට අදාළ ක්‍රියාකාරකම් ආශ්‍රිත වැය ලෙජරය පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දරන ලද රු.165,120ක ඉන්ධන වියදම්ද, රු. 20,544ක අතිකාල දීමනා ගෙවීම්ද, රු. 38,550ක අධිවේගී මාර්ග බිල්පත් පියවීම්ද වශයෙන් එකතුව රු. 224,214ක්වූ පුනරාවර්තන වියදම් අංක 151-2-3-078-2506 දරන ධීවර අංශයේ යටිතල පහසුකම් සඳහා වන මූලධන වැය විෂයෙන් ගෙවා තිබුණි.

(ii) ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දරන ලද රු. 200,894 ක ඉන්ධන වියදම්ද, රු. 45,910ක අතිකාල දීමනා ගෙවීම්ද, රු. 72,350ක අධිවේගී මාර්ග බිල්පත් පියවීම්ද වශයෙන් එකතුව රු. 319,154ක්වූ පුනරාවර්තන වියදම් අංක 151-2-3-079-2506 දරන ධීවර අංශයේ යටිතල පහසුකම් සඳහා වන මූලධන වැය විෂයයට සාවද්‍ය ලෙස ඇතුළත් කර ගෙවීම් කර තිබුණි.

2.3 අත්තිකාරම් සීමා
-----------------

අංක 06/2022 හා 2022 සැප්තැම්බර් 21 දිනැති මුදල්, ආර්ථික, ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අහෝසි වූ රාජ්‍ය අමාත්‍යාංශවල රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ ශේෂයන් නව අමාත්‍යාංශය වෙත පැවරීම 2022 නොවැම්බර් 15 දිනට ප්‍රථම සිදු කර, අත්තිකාරම් ගිණුම් සීමාව සංශෝධනය කරවා ගත යුතු බව සඳහන්ව තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශයෙන් අත්තිකාරම් “බී” ගිණුමේ ණය ශේෂ පවරා ගැනීමක් සිදුකර තිබීම නිසා වියදමෙහි උපරිම සීමාව රු.243,572 කින් ඉක්මවීමක් සිදු වී තිබුණුද, එම උපරිම වියදම් සීමාව සංශෝධනය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(i) පටහැනිව මෙහෙයුම් වැය විෂයයකට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.40,987,670 ක බැරකම්වලට එළඹී තිබුණු අතර සංවර්ධන වැය විෂයයන් 2කට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.353,778,496 ක් බැරකම්වලට එළඹී තිබුණි. ඒ අනුව එකතුව රු.394,766,166 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) ධීවර අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි මෙහෙයුම් වැඩසටහනකට හා සංවර්ධන වැඩසටහනකට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.1,165,662,699 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 වාර්තාව අනුව භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති බැරකම් ශේෂය රු.740,916,331 ක් විය. මෙ අනුව අමාත්‍යාංශ බැරකම් විස්තරය සහ භාණ්ඩාගාර බැරකම් විස්තරය අතර රු.424,746,368 ක වෙනසක් නිරීක්ෂණය වන අතර වෙනසට හේතු අනාවරණය කරගෙන ද නොතිබුණි. මෙ අනුව ධීවර අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරයට වාර්තා නොකළ රු.424,746,368 ක වටිනාකමින් යුත් බැරකම් සඳහා එළඹ තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ධීවර අමාත්‍යාංශය විසින් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනයේ ඇතුළත් සමාලෝචිත වර්ෂයට අදාල රු.4,502,358 ක වටිනාකමකින් යුත් බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත SA 92 වාර්තාවේ බැදීම් හඳුනාගෙන තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි බැදීම් හඳුනාගෙන නොතිබුණි.

(ඉ) බැරකම් ලේඛනයට ඇතුළත් නොවන කිසිදු ගෙවීමක් හෝ බැරකමක් මුදල් රෙගුලාසි 115 යටතේ ගෙවීම් කල නොහැකි බව දක්වා තිබුණ ද, 2022 වර්ෂයේ රු.3,015,191 ක මුදලක් 2022 දෙසැම්බර් මාසය සඳහා බිල්පත් ගාස්තු වශයෙන් 2023 ජනවාරි සහ පෙබරවාරි මස ලැබී තිබුණු අතර, එම බිල්පත්වල වටිනාකම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395(ඇ) පටහැනිව අංක 7042730 දරන නිල බැංකු ගිණුමේ 2022 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල බැංකු සැසඳුම් ප්‍රකාශ දින 77ත් දින 16ත් අතර කාලපමාවකින් පසුව 2023 පෙබරවාරි 01 වන දින පිළියෙල කර තිබුණි.

**2.6** බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව බදු අයකළ හැකි ලියාපදිංචි තැනැත්තෙකු සැපයුමක් කරන අවස්ථාවේ දී ඔහු විසින් බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කල යුතු වුවද, පැවති ධීවර රාජ්‍ය අමාත්‍යාංශය විසින් අවස්ථා 4 කදී බදු ඉන්වොයිස් ඉදිරිපත් නොකළ සැපයුම්කරුවන් 4 දෙනෙකු වෙත එකතුකළ අගය මත බදු ලෙස එකතුව රු.335,863 ක් ගෙවා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 හා 5.4.12 ප්‍රකාරව සපයන ලද භාණ්ඩ මත හෝ කරන ලද වැඩ මත වැට් බදු ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර, එකී ගෙවීම් පිළිබඳ විස්තර, විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දිය යුතු වුවත් පැවති ධීවර රාජ්‍ය අමාත්‍යාංශය විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

**2.7** අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැවති ධීවර රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් ඉන්ධන නිකුත් කිරීම සඳහා සීමාසහිත ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට පියවීමේ පදනම මත රු.50,000 ක මුදලක් තැන්පතුවක් වශයෙන් 2022 පෙබරවාරි 18 දින ගෙවීම් කර තිබුණු අතර මෙම මුදල වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත් මෙම තැන්පතු මුදල 2022 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොතිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අයවීම් හිඟ හිට තිබුණු ණය ශේෂවල එකතුව රු.1,095,937.29 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂවලින් රු.956,055.29 ක් හෙවත් සියයට 87 ක් වර්ෂ 5 ට වැඩි කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟ හිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ ද අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තු පාලන ගිණුමේ සහ දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුල හර හා බැර කිරීම් ද, දෙපාර්තමේන්තු පොත් අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ අතර වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | දෙපාර්තමේන්තු පොත් අනුව | දෙපාර්තමේන්තු පාලන ගිණුම අනුව | ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වර්ෂය තුළ හර කිරීම් | 11,763,453.00 | 11,625,453.00 | 8,863,593.00 |
| වර්ෂය තුළ බැර කිරීම් | 10,158,023.71 | 10,020,023.71 | 9,860,004.71 |

**(iii)** අත්තිකාරම් "බී" ගිණුමේ අයනොවී පවතින නිහ හිටි ණය ශේෂ උපලේඛනය තුල නිවසක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපලක් හෝ අත්කර ගැනීම සඳහා නිලධාරීන් 07 දෙනෙකුට ලබා දී තිබූ රු.160,481 ක්වූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.7 ඡේදය ප්‍රකාර ගිවිසුමට ඇප බැඳුම්කරය, පැවරිය නොහැකි ඇටොර්නි බල කඩදාසිය සහ හිමිකම් ඔප්පුව යනාදි මුල් ලියවිලි ණය ලබාදුන් දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගෙන තිබේද යන්න කරුණු විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකි විය.

**2.8** තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, ධීවර අමාත්‍යාංශයේ වර්ෂ 2 ඉක්ම වූ එකතුව රු.54,561,722 ක තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.10,726,309 ක තැන්පතු පැවතීමට හේතු පසුව ඉදිරිපත් කරන බව විගණනය වෙත දන්වා තිබුණ ද, මේ දක්වා එම හේතු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** දළ රළ සවිය 2022 - ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ ආයතන විසින් ධීවර අමාත්‍යාංශය වෙත රු.3,250,000 ක මූල්‍යාධාර ලබා දී තිබුණු අතර අංක 6000-0-0-13-0-040-0 දරන තැන්පත් ගිණුමේ එම මුදල් තැන්පත් කර තිබුණි. ධීවර දිනය වෙනුවෙන් රු.2,741,648 ක වියදම් දරා 2022 දෙසැම්බර් 31 දින වන විට රු.508,352 ක් තවදුරටත් තැන්පත් ගිණුමේ ඉතිරිව පැවති අතර එම මුදල රාජ්‍ය ආදායමට බැරකර නොතිබුණි.

**(ඇ)** අංක 6000-0-0-16-0-140 දරන කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුම

**(i)** කේවල ශේෂ ලැයිස්තුවෙහි එකතුව රු.85,252,201 ක් වන අතර වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ (4) ආකෘතිය යටතේ වන මෙම තැන්පතු ගිණුමෙහි ශේෂය රු.83,251,173 ක් වූයෙන් රු.2,001,028 ක වෙනසක් පැවතුණි.

(ii) විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ සැසඳුම් ප්‍රකාශයෙහි ඇමුණුම් 01 මගින් ඉදිරිපත් කර තිබෙන අවුරුදු 2 ට වැඩි තැන්පතු 4 ක වටිනාකම් හා ඇමුණුම 02 මගින් ඉදිරිපත් කර ඇති කේවල ශේෂ ලැයිස්තුවේ එම තැන්පතු වල වටිනාකම් අතර රු.2,001,053 ක වෙනසක් පැවතුණි.

(iii) අංක 6000-0-0-16-0-140 දරන තැන්පතු ගිණුමේ රු.1,917,193 ක තැන්පතු රජයේ ආදායමට මාරු කිරීමට නියමිත බවට සඳහන් කර තිබුණ ද විගණිත දිනය වන විටත් එම තැන්පතු රජයේ ආදායමට බැරකර නොතිබුණි.

2.9 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 සැප්තැම්බර් 30 දින පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ අත ඉතිරිව තිබුණු රු.339,566 ක මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර මුදල් පොත පියවා අවසන් කර තිබිය දී, 2022 සැප්තැම්බර් 30 දිනට සකස් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි මුදල් පොතෙහි ශේෂය රු.339,566 ක් ලෙස දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

(ආ) ධීවර අමාත්‍යාංශයේ පසුගිය වර්ෂය සඳහා ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) ට අනුව උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතියට අදාල අංක 7040777 දරන බැංකු ගිණුම යටතේ 2021 දෙසැම්බර් 31 දිනට රු.48,700 ක ශේෂයක් පැවතුණි. නමුත් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) ට අනුව එම බැංකු ගිණුමේ විස්තර ඇතුළත් කර නොතිබුණු අතර එකී ගිණුමට අදාල, බැංකු ප්‍රකාශ හා බැංකු සැසඳුම් ප්‍රකාශ ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව 2022 ජනවාරි 01 දිනට පැවති රු.48,700 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි ද, හා එම බැංකු ගිණුම මේ වනවිට වසා දමා ඇති ද යන්න විගණනයට තහවුරු නොවිය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ධීවර අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ ඇස්තමේන්තුව මගින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 9 ක් හඳුන්වා දී තිබුණ ද, 2022 වර්ෂයේ පිළියෙල කල ක්‍රියාකාරි සැලැස්ම හා ඒ අනුව පිළියෙල කල කාර්යසාධන ඇගයීම් වාර්තාවට පහත සඳහන් කාර්යයන් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණි.

- වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාවන් ලබාදීම.
- ටින්මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම.
- සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) (i) 2022 අයවැය ඇස්තමේන්තුවේ සඳහන් පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ 151-2-4- හා 151-2-7 යටතේ පවතින ක්‍රියාකාරකම් වල කාර්යසාධනය 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අදාල ඇගයීම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණු නිසා එම අංශවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ii) ඔරුවැල්ල පුවත්පත සහ ධීවර නවෝදය ගුවන්විදුලි වැඩසටහන හා උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය 2022 දෙසැම්බර් 31 දිනට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අදාල ඇගයීම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණු නිසා එම වැඩසටහන්වල භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(iii) අංක FLS/B/MF/2/22/INF 8 හා 2023 පෙබරවාරි 08 දිනැති විගණන අධිකාරිගේ ලිපිය මගින් 2022 වර්ෂය සඳහා එක් එක් මාසයට අදාලව මුද්‍රණය කරන ලද පුවත්පත් සංඛ්‍යාව සහ එම පුවත්පත් බෙදා හැරීමේ ලේඛනය විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් සිදුකර තිබුණි. ඒ අනුව ලේක් හවුස් ආයතනය විසින් මුද්‍රණය කරනු ලබන දිනමිණ හා තිරකරන් පුවත්පත් සමඟ මේ පුවත්පත් බෙදා හැරීම සිදු කරන බවත්, මීට අමතරව අතිරේක පිටපත් 2000 ක් බැගින් අමාත්‍යාංශය වෙත ලබාදෙන බවත් ඒවා අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් හරහා ධීවර සමිති සහ අනෙකුත් පාර්ශවයන් වෙත බෙදා හරින බවත් පිළිතුරු ලිපියේ සඳහන් කර තිබුණි. සමිති වෙත ලබාදෙන පුවත්පත් පිළිබඳ ලේඛන 2 ක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණ ද එය කුමන මාසයට අයිතිද යන්න විගණනය වෙත දන්වා නොතිබුණි. එමෙන්ම මසකට මුද්‍රණය කරන පිටපත් සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කර නොමැති අතර ලේක් හවුස් ආයතනයේ තොරතුරු මත පදනම්ව සනාථ කරගෙන පවතින බව විගණනය වෙත දන්වා තිබුණි.

**3.2** කළමනාකරණ දුර්වලතා

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයභාර්යයන් සහ තොරතුරු ජනගත කිරීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කරගැනීම සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව ධීවර අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නිර්මාණය කළ එම ආයතනයෙන්ම මෙම කාර්යය ඉටුකර ගැනීම යෝග්‍ය බව **2021** මාර්තු **31** දින නිර්දේශ කර **2021** අප්‍රේල් **06** දින රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.**250,000** ක මුදලකට එම ආයතනයෙන් වෙබ් අඩවිය නිර්මාණය කර ගැනීමට තීරණය කර තිබුණි. **2021** අප්‍රේල් **30** දින ධීවර රාජ්‍ය අමාත්‍යාංශය හා එම ආයතනය අතර විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබූ අතර **2021** අගෝස්තු **03** හා **2022** අප්‍රේල් **22** දිනයන්වලදී පිළිවෙලින් රු.**75,000** ක් හා රු.**100,000** ක් වශයෙන් එකතු වටිනාකම රු.**175,000** ක් එම ආයතනය වෙත ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වෙතත් සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේ දී ගිවිසුම් ප්‍රකාරව වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනය **2021** වර්ෂය ආරම්භයේ සිදුකර තිබුණ ද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.3.1**(අ) ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා **2.5.1**(ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.

(ආ) මෙම ප්‍රසම්පාදනය සඳහා තනි සැපයුම්කාර මූලාශ්‍රයකින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමයෙන් ප්‍රසම්පාදනය කර තිබූ අතර වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වැනි, තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වර්තමානයේ ඉතා තරඟකාරී, උනන්දුවක් දක්වන පාර්ශවයන් විශාල සංඛ්‍යාවක් සිටින විට කිසිදු තරඟයක් නොමැතිව මෙම සෘජු කොන්ත්‍රාත් ක්‍රමය තෝරා ගැනීම තුලින් යෝග්‍යතාවයෙන් යුතු උනන්දුවක් දක්වන පාර්ශව වලට ප්‍රසම්පාදන කටයුතු වලට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන සහ උපරිම අවස්ථා ලබාදීම ඇතුලු රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ඉටුවිය යුතු ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ **2.1.1** ඇතුලත් මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **5.4.8** ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් මෙම කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු බැවින් ප්‍රසම්පාදනය තුලින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 අප්‍රේල් 30 දින අත්සන් කර තිබූ ගිවිසුමේ 2 වන වගන්තිය අනුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කල දින සිට සති 12 ක් තුල මෙම වෙබ් අඩවිය නිර්මාණය කර අවසන් කල යුතු වුවත් රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වන 2022 සැප්තැම්බර් 30 දින වන විටත් එනම් සති 74 ක් ගත වන දින වන විටත් වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබුණි.

(ඉ) කොන්ත්‍රාත් ගිවිසුමේ 4 වන වගන්තිය අනුව දෙවන ගෙවීම් දිනයේ සිට සති 7 ක් ඇතුලත **(Completion of Full Functional English Version of Website)** නිමකල යුතු බව සඳහන් වුවද මෙම කාර්යය නිමකර ගෙවීම් ලබාගැනීම සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කර තිබුණේ ආරම්භක දින සිට සති 38 ක් ගතවීමෙන් පසුවය. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක් ද සිදුකර නොමැති අතර මෙම කොන්ත්‍රාත් ගිවිසුම සකස් කිරීමේ දී "වැඩ ප්‍රමාද වී ඇත්නම් ඒ සඳහා ප්‍රමාද කුලී අය කිරීම සිදුකරන බව" කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන අස්ථිත්වයට ප්‍රසම්පාදනය තුළින් රජයට සිදුවන අවාසිය වළක්වා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර තිබුණි.

(ඊ) කොන්ත්‍රාත් ගිවිසුමේ 4 වන වගන්තිය ප්‍රකාරව දෙවන ගෙවීම **(Completion of Full Functional English Version of Website)** සිදුකිරීම කොන්ත්‍රාත් මුදලින් සියයට 30 ක් වන නමුත් කොන්ත්‍රාත් ආයතනය විසින් 2022 ජනවාරි 25 දින කොන්ත්‍රාත් මුදලින් සියයට 40 ක් එනම් රු.100,000 ක් 2022 අප්‍රේල් 22 දින ගෙවීම් සිදුකිරීම නිසා කොන්දේසිවලට පටහැනිව රු.25,000 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(උ) කොන්ත්‍රාත් ගිවිසුමේ 6 වන වගන්තිය ප්‍රකාරව කාර්යය දීර්ඝ වශයෙන් ප්‍රමාදවීම් සිදු වන්නේනම් ඒ බව ලිඛිතව කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඌ) කොන්ත්‍රාත් ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව රක්ෂණ ආවරණයක් ලබා දී නොතිබූ අතර, වෙබ් අඩවිය නිර්මාණය කිරීමට රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වන දින වන විට සති 74 ක් ගත වී තිබුණ ද කොන්ත්‍රාත් ගිවිසුමේ 15 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධ කටයුතු කිරීමක් හෝ ගිවිසුම අවසන් කිරීමක් හෝ ඒ පිළිබඳ කිසිදු තීරණයකට එළඹීමක් සිදුකර නොතිබුණි. 2023 පෙබරවාරි 27 වන විගණිත දිනය වන විටත් රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබුණු අතර වර්තමානය වන විට ධීවර රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී එහි කාර්යයන් හා කර්තවයන් ධීවර අමාත්‍යාංශය යටතට පැවරී තිබූ බැවින්, රාජ්‍ය

අමාත්‍යාංශය සඳහා නිල වෙබ් අඩවියක් අවශ්‍යතාවයක් තිබේ ද විගණනයේ දී ගැටලු සහගත විය. එම නිසා වෙබ් අඩවිය වෙනුවෙන් දරා ඇති මුළු මුදල රු.175,000 ක් වන අතර, ඒ සඳහා ගතකර තිබූ කාලය, වියදම, වර්තමානය වන විට නිෂ්කාර්යය වියදමක් බවට පත් ව තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ධීවර අමාත්‍යාංශය යටතේ 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලවල තොරතුරු පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජොෂ්ඨ විධායක මට්ටම | 27 | 23 | 04 | - |
| තෘතියික මට්ටම | 05 | 04 | 01 | - |
| ද්විතියික මට්ටම | 96 | 89 | 26 | 19 |
| ප්‍රාථමික මට්ටම | 48 | 35 | 13 | - |
| වෙනත් | 03 | 01 | 02 | - |

(i) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු සඳහා වැඩ ආවරණ නිලධාරීන් පත්කර තිබුණ ද, අමාත්‍යාංශයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි.

(ආ) මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/16 දරන ලිපිය අනුව පැවති රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 10 ක් ලෙස ද අනුමත කාර්යය මණ්ඩලය සම්බන්ධව යම් සංශෝධනයක් සිදුකල යුතු වන්නේනම් ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව සඳහන්ව තිබුණ ද ධීවර රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වන 2022 සැප්තැම්බර් 30 දින වන විට සංවර්ධන නිලධාරීන් 54 දෙනෙකු සඳහා 2022 මාර්තු සිට නොවැම්බර් දක්වා කාලය තුල රු.19,654,380ක් වැටුප් හා වේතන වශයෙන් ගෙවීම් සිදුකර තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ,රාජ්‍ය අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය හා වෙනත් ආයතන වෙත මුදාහළ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වෘත්තීය සමිති කටයුතු සම්බන්ධීකරණය සඳහා කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශයන්හී සහකාර ලේකම් (වෘත්තීය සමිති හා සේවක සබඳතා ) (ශ්‍රී.ලං.ප.සේ.නොවන) තනතුරු ඇති කිරිම යන මැයෙන් 2021 නොවැම්බර් 30 දිනැති අංක අමප/21/1998/301/021-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2021 දෙසැම්බර් 06 දින සිට කොන්ත්‍රාත් පදනම මත උක්ත තනතුර සඳහා අයකු පත් කර තිබුණි. මෙම නිලධාරිනිය වෙත 2022 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාලව වැටුප් ලෙස රු. 274,597 ක් ගෙවා තිබුණි. පත්වීමේ නිරවද්‍යතාවය සම්බන්ධව තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් 2021 දෙසැම්බර් සිට 2022 අප්‍රේල් දක්වා ජීවන වියදම් දීමනාව සහ අන්තර් දීමනාව වශයෙන් එකතුව රු.39,203 ක් ගෙවා තිබීමේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. තවද 2022 අප්‍රේල් 18 දින මෙම නිලධාරිනියගේ සේවය අවසන් කර තිබූ අතර මෙම නිලධාරිනිය වෙනුවෙන් එදින සිට 2022 අප්‍රේල් 30 දින දක්වා වැඩිපුර ගෙවා තිබුණු වැටුප් හා දීමනා වූ රු.23,569ක මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

(ii) 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් නිකුත් කරන ලද ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවය කරනු ලබන සහය කාර්ය මණ්ඩලය හැකිතාක් දුරට රාජ්‍ය නිලධාරීන් අතරින් තෝරා ගත යුතු බවට සඳහන් වුවත් ඊට පටහැනිව රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්වරයාගේ ඉල්ලීම මත නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 201 (2) පටහැනිව අමාත්‍යවරයාගේ කාර්යාලයේ නියුතු සහය කාර්ය මණ්ඩලය සඳහා පැමිණීම හා පිටවීම අත්සන් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබියදී වැටුප් ගෙවීම, අඩ වැටුප් ගෙවීම හෝ නිවාඩු පිළිබඳ විස්තර කිසිවක් නොමැතිව මුළු කාල පරිච්ඡේදයටම අදාළව වැටුප් ගෙවා තිබුණි. ඒ අනුව 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාළව නිලධාරීන් 22 දෙදෙනෙකුට රු.4,552,850ක් වැටුප් ලෙස ගෙවීම නිරවද්‍යතාවය තහවුරු නොවීය.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 - කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** | |
| 2022 වර්ෂයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 397,230 කින් වැඩිකිරීම | √ | | | $\frac{397,230}{435,910}$ X 100 = 91% |
| එක් දිනක් තුළ ග්‍රෑම් 32.49 කින් ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම | √ | | | $\frac{32.49}{38.4}$ X 100 = 84.6% |

## 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .

| ඉලක්ක / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%- 74% | 75%- 100% | |
| තිරසාර සංවර්ධන ඉලක්කය 14 (තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය.) | 2022 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 423,500 කි | මෙ.ටො 397,230 | | | √ | $\frac{397,230}{423,500}$ X 100 = 93.79% |
| | 2022 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 110,000 කි | මෙ.ටො. 116,620 | | | √ | $\frac{116,620}{110,000}$ X 100 = 106% |
| | 2022 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 38.4 දක්වා වැඩි කිරීම. | දිනකට ග්‍රෑම් 32.49 | | | √ | $\frac{32.49}{38.4}$ X 100 = 84.6% |
| තිරසර සංවර්ධන ඉලක්ක 12 (තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම.) | මත්ස්‍ය අපනයන වැඩිකිරීම 2022 වසරේදී මෙ.ටො. 32,700 දක්වා වැඩි කිරීම | මෙ.ටො. 25,730 | | | √ | $\frac{25,730}{32,700}$ X 100 = 78.68% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

| ඉලක්ක/ අරමුණු | වර්තමාන ප්‍රගතිය | වගකිව යුතු ආයතන |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු 14 - තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය. | | |
| 14.4 2022 වන විට මසුන්ගේ ජීව විද්‍යාත්මක ගති ලක්ෂණ අනුව තීරණය වී ඇති ආකාරයට තිරසාර වශයෙන් උපරිම අස්වැන්නක් ලබාදිය හැකි ආකාරයට මත්ස්‍ය සම්පත් හැකි කෙටිම කාලයකදී නැවත යථා තත්වයට පත් කිරීම සඳහා කාර්යක්ෂම ලෙස මසුන් ඇල්ලීම පාලනය කිරීම සහ අසීමිතව, නීති විරෝධී, වාර්ථා නොකළ සහ පාලනය නොකළ හා හානිකර මසුන් මැරීමේ ක්‍රම භාවිතය අවසන් කිරීම සහ විද්‍යාත්මක පදනමකින් යුක්ත කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම.<br><br>14.4.1ජීව විද්‍යාත්මක තිරසර මට්ටම් තුළ පවත්නා මත්ස්‍ය තොග ප්‍රමාණය | 2020 වර්ෂයේ ශ්‍රීලංකාවේ ඊසාන දිග වෙරල තීරයේ කුඩා මසුන්ගේ ජෛව සනත්වය මෙ.ටො 2240<br><br>මද්‍යම ප්‍රමාණයේ මසුනගේ ජෛව සනත්වය මෙ.ටො 2271.3<br><br>නාරා ආයතනය මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, පොකිරිස්සන් (*Panulirus homarus)* තොග තක්සේරු කිරීමේ ප්‍රතිඵල අනුව, ඔවුන්ගේ බිජුලෑමේ හැකියා අනුගතයේ සමතුලිතතාවය 27% කි. | නියාමන මිනුම් NARA සහ ධීවර දෙපාර්තමේන්තුව සිදු කරයි. |
| 14.6 2022 වන විට පවත්නා ධාරිතාවට වැඩි සහ අධික ලෙස මසුන් මැරීමට හේතුවන විශේෂ ධීවර සහනාධාර තහනම් කිරීම, නීති විරෝධි, වාර්තා නොවන, පාලනය නොකළ ධීවර කර්මාන්තයට ඉඩ සලසන සහනාධාර ඉවත් කිරීම, සංවර්ධනය වෙමින් පවතින රටවලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට සුදුසු අන්දමින් ඵලදායී ලෙස විශේෂ කොට සහ වෙනස් අන්දමින් සැලකීමේ වැදගත්කම හඳුනා ගනිමින් ලෝක වෙළෙඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡාවලදී ඒවා අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් කිරීම<br><br>14.6.1 රටවල් අනුව නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම මැඩලීම ඉලක්ක කරගත් ජාත්‍යන්තර ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ මට්ටම පිළිබඳ ප්‍රගතිය | ඉන්දීය සාගර ටූනා කොමිසම් නීති හා ගිවිසගත් කොන්දේසි වලට අනුගත විමේ මට්ටම 2020 වර්ෂයේ 86% ක් වූ අතර 2030 වර්ෂයේ 100% ඉලක්කයට ලංවීමට අපේක්ෂිතය. | නීති විරෝධි ධීවර කටයුතු මැඩපැවැත්වීමට ධීවර දෙපාර්තමේන්තුව, NARA සහ NAQDA යන ආයතන මඟින් වගකිවයුතු ධීවර කර්මාන්තය හා අන්තර් ජාතික ක්‍රමවේද අනුගමනය සඳහා වන චර්යා පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. |
| 14.7 2030 වන විට තිරසර ලෙස ධිවර සම්පත්, ජලය ආශ්‍රිත | වර්තමාන ආර්ථික තත්ත්වය හේතුවෙන් දළ දේශීය | ජලජ සම්පත් තිරසාර ලෙස උපයෝජනය සඳහා ධීවර |

| | | |
|---|---|---|
| සංස්කෘතික සහ සංචාරක කර්මාන්තය කලමනාකරණය හා තිරසර අන්දමින් සමුද්‍රීය සම්පත් භාවිතා කරමින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය වලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කිරීම<br><br>14.7.1 සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දූපත් රාජ්‍යයන් ඌන සංවර්ධිත රටවල් වල දළ දේශීය නිෂ්පාදනයේ පංගුවක් ලෙස තිරසර ධීවර කර්මාන්තය | නිෂ්පාදනයේ පංගුවක් ලෙස ධීවර කර්මාන්තය 1.1% මට්ටමේ පවතී. එය 2030 වන විට 1.2% දක්වා වැඩි කර ගැන්මට අපේක්ෂිතය. | දෙපාර්තමේන්තුව සහ NARA ආයතන මගින් මගින් නියාමනය කරන ලදී. |
| 14. අ) කුඩා පරිමාණ පාරම්පරික ධීවරයින්ට සමුද්‍රීය සම්පත් සහ වෙළෙඳපොලට පිවිසීමට අවස්ථාව ලබා දීම<br>14.අ.1 රටවල් අනුව කුඩා පරිමාණ ධීවර කර්මාන්තය වෙනුවෙන් ඇති ප්‍රවේශ අයිතිය පිළිගන්නා සහ ආරක්ෂා කරන නෛතික/ නියාමන/ ප්‍රතිපක්තිමය/ ආයතනික කාර්ය රාමුවක් භාවිතයට ගැනීමේ ප්‍රගතිය | සුළු පන්න ධීවරයින් සඳහා කලමනාකරණ සැලසුම් සකස් කරමින් පවතී. 75%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. | ධීවර දෙපාර්තමේන්තුව සහ NARA ආයතන මගින් මගින් නියාමනය කරන ලදී. |
| 14.ආ) "අපට අවශ්‍ය අනාගතය (The Future We Want)" හි 158 වන ජේදයේ සඳහන් කර ඇති පරිදි, සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණයට සහ තිරසාර අන්දමින් භාවිතා කිරීමට නීතිමය වැඩ සැලැස්මක් සපයන්නාවූ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියෙහි දැක්වෙන නීති අනුව සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම වැඩි දියුණු කිරීම.<br>14.ආ.1 සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන සමුද්‍රීය නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය මගින් දැක්වෙන නෛතික ප්‍රතිපත්තිමය සහ ආයතනික කාර්ය රාමු, ජාත්‍යන්තර නීතිය ක්‍රියාවට නංවන සමුද්‍රීය ක්ෂේත්‍රය සම්බන්ධව ක්‍රමෝපායන්ට එකඟතාවය පළකිරීමේ ප්‍රගතියක් දක්වා ඇති රටවල් සංඛ්‍යාව | ධීවර ක්ෂේත්‍රෙය් මධ්‍යකාලීන සැලැස්ම, 2021-2025 සකස් කර ඇත.<br>2023-2027 සකස් කරමින් පවතී | ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්ති ප්‍රකාශනය පදනම් කරගෙන මෙම ප්‍රගතිය නිර්ණය බලාත්මක කිරීම හා ප්‍රවේශය මත සිදු කරන අතර ධීවර අමාත්‍යාංශයේ නීති රාමුව හරහා UNCLOSE හා එකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිර්ණය කරයි. |
| තිරසර සංවර්ධන අරමුණු 12 - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම | | |
| ආහාර හා අලාභ දර්ශකය | | |
| 12.3 2030 වන විට සිල්ලර සහ පරිභොජන මට්ටම්වල ඒක | කාලය සමඟ සැපයුම් දාමය ඔස්සේ ආහාර විනාශ වීමේ ප්‍රතිශතයෙහි වෙනස් වීම් පිළිබඳ | ධීවර දෙපාර්තමේන්තුව සහ NARA ආයතන මගින් මගින් |

| | | |
|---|---|---|
| පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නාවූ අපතේ යාම අවම කිරීම.<br><br>12.3.1 ලෝක ආහාර හානි දර්ශකය. | දර්ශකය, අස්වනු ලබාගැනීමේ අවදි, පසු අස්වැන්න සමඟ හඳුනාගත් ප්‍රධාන නිර්ණායක මත පදනම්ව ආහාර අලාභ දර්ශකය ගණනය කළ යුතුය. ප්‍රවාහනය, ගබඩා කිරීම, සකස් කර බෙදා හැරීම, ඇසුරුම් කිරීම ආදි කරුණු සලකා බලයි. | නියාමනය කරන ලදී. |

## 5.2.2 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ඇති අභියෝග හා පරතර

1. මෙම කාල පරාසය තුලදී ඇතිවූ ඉන්ධන හිඟ තත්වය, ඉන්ධන මිල ඉහළ යාම,ශ්‍රම වියදම ඉහළ යාම හා අයිස් වැනි යෙදවුම් ද්‍රව්‍ය වල මිල ඉහළ යාම හේතුවෙන් ධීවරයින් මත්ස්‍ය කර්මාන්තයට දක්වන රුචිකත්වය අඩුවීම.
2. මත්ස්‍ය නිෂ්පාදන වල මිල ගණන් පසුගිය වසරේ මෙම කාලයට සාපේක්ෂව දෙගුණයකින් පමණ ඉහළ ගොස් ඇති බැවින් මත්ස්‍ය පරිභෝජනය සාපේක්ෂව අඩු වීම.
3. වෙරළබඩ සම්පත් බොහොමයක් විද්‍යාත්මක සාක්ෂි නොමැතිව දුර්වල ලෙස කළමනාකරණය කර ඇත.ඇතැම් අවස්ථා වල සම්පත් භාවිතා කරන්නන් දුර්වල ලෙස අධීක්ෂණය කිරීම තුළින් සම්පත් අධික ලෙස සූරාකෑම සහ විනාශ වීම සිදු වේ.එබැවින් කළමනාකරණය කරන්නන්ගේ සහ පරිශීලනය කරන්නන්ගේ සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ආකල්ප වර්ධනය කළ යුතුය. මීට අමතරව පවත්නා නීතිය බලාත්මක කිරීමට බලාත්මක කිරීමේ නිලධාරීන්ට නිසි දැනුම හෝ පහසුකම් ලබා දීම අවශ්‍යව ඇත.
4. ධීවර හා සාගර අංශ සම්බන්ධ නවීන පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීමට තාක්ෂණික හා මූල්‍යමය බාධා හේතු වී ඇත. සාමාන්‍ය ජනතාව අතර සමුද්‍ර පරිසර පද්ධති වල වටිනාකම පිළිබඳ දුර්වල දැනුවත්භාවය ඒවා විනාශ වීමට හේතු වේ. විවිධ ආයතන අතර කාර්යභාරයන් එකිනෙක අතපසු වී පැවතීම තුළ අවසානයේ කිසිවෙකු වගකීම භාර නොගනී. ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළ බඩ සම්පත් කළමනාකරණය සඳහා ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැතිවීම බරපතල කාරණයකි.
5. නීති විරෝධී හා හානිදායක පරිදි මසුන් ඇල්ලීමේ අවදානමක් පැවතීම.
6. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දුර්වලතා.
7. කලමනාකරණය සහ මත්ස්‍ය වෙළදාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.
8. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසාර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව
9. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම.

## 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 27 | 23 | 04 |
| තෘතීයික | 05 | 04 | 01 |
| ද්වීතියික | 96 | 89 | 26 |
| ප්‍රාථමික | 51 | 36 | 15 |

### 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ.

සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

### 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (Rs. '000) | | වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේ ශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| අලුතින් පත් කරන ලද අය සඳහා පුහුණු කිරීම් සවර්ධන නිලධාරි | 34 | 2022.02.14 \| 2022.02.19 | 40,500/- | - | දේශීය | පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාව ඉහළ නංවා ඇත. |
| Essential in system & Network Administration | 2 | 2022 Oct. 15,19,25,26 2022 Nov. 01 | 60,000/- | - | දේශීය | |
| රියදුරු පුහුණු වැඩ සටහන | 17 | 2022.10. 29,30 | 31,085/- | - | දේශීය | |
| වැටුප් පරිවර්තන | 30 | දින 01 | 24,000/- | - | දේශීය | |
| රජයේ නිලධාරින්ගේ නිවාඩු | 18 | දින 01 | 16,000/- | - | දේශීය | |

## 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| **02** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,3 | විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරිම ( මු.රෙ 135)** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | ඇතැම් විගණන විමසුම් වලට අමාත්‍යාංශයේ විවිධ අංශ මගින් තොරතුරු කැඳවා ඇත | පිළිතුරු ලබාගත් පසු කඩිනමින් පිළිතුරු ලබාදීමට නියමිතය |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසම හසාකච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | කමිටු 04 ට අදාල කරුණු සාකච්ඡා කර ඇත. | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | . | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වසර 20 ට වඩා පැරණි ණය ශේෂවල තොරතුරු සොයාගැනීමට අපහසු බැවින් ක්‍රියා කිරීම දුෂ්කර වී ඇත | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම | අදාල නැත | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නැත | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නැත | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන | අනුකූල නොවේ | මානව සම්පත් | මානව සම්පත් |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | | සැලැස්ම පිළයෙල කරමින් පවතියි | සැලැස්ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |